වාර්ෂික වාර්තාව - 2013

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

ஆண்டறிக்கை- 2013

ஊவா வெல்லஸப் பல்கலைக்கழகம்

Uva Wellassa University

Annual Report - 2013

Uva Wellassa University

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
පස්සර පාර
බදුල්ල

ஊவா வெல்லஸப் பல்கலைக்கழகம்
பசறை வீதி
பதுளை

Uva Wellassa University
Passara Road
Badulla

UWU

Uva Wellassa University

වාර්ෂික වාර්තාව - 2013

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

අන්තර්ගතය

01. අපගේ දැක්ම 01

02 අපගේ මෙහෙවර 01

03. උප කුලපතිතුමාගේ පණිවුඩය 02

04. මානව සම්පත් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 04

05. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ බඳවා ගැනිම පිළිබඳ විස්තර 05

06. අධ්‍යයන කාර්ය මණ්ඩලය 08

- **06.1** අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 08
- **06.2** පුස්තකාල කාර්ය මණ්ඩලය 09

07. පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 09

- **07.1** පරිපාලන කාර්ය මණ්ඩලය 09
- **07.2** උපකාරක කාර්ය මණ්ඩලය 10
- **07.3** උපකාරක කාර්ය මණ්ඩලය බෙදි ගොස් ඇති ආකාරය 11

08. පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන 12

09. වැඩසටහන් , සම්මන්ත්‍රණ හා වැඩමුළු 12

10. ලැබුණු සම්මාන ප්‍රදානයන් පිළිබඳ විස්තර 12

11. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 13

12. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 13

13. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත) 13

14. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත) 14

15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) 14

16. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) 15

17. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2013 15

18. 2013 වර්ෂයේදී ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර 16

19. 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 17

20. 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය 18

21. 2013 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය 19

22. විගණකාධිපතිතුමාගේ වාර්තාව 20

23. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ මතු කෙරුණු කරුණුවලට පිළිතුරු 31

Uva Wellassa University

1. අපගේ දැක්ම

සෞභාග්‍යය හා යහපැවැත්ම සාක්ෂාත් කර ගනු පිණිස පිබිද එන කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර තුළ දැනුම, තාක්ෂණයන්, තිරසාර නිෂ්පාදන පිළිවෙත් හා ක්‍රියාවලින්, ව්‍යවසායකත්වය, තිරසාර කළමනාකරණ පිළිවෙත් හා ක්‍රියාවලීන් යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම නිර්මාණය කිරීම හා ප්‍රචලිත කිරීම හරහා ජාතික සම්පත්වලට අගය එක් කිරීම සඳහා වූ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත් වීම.

2. අපගේ මෙහෙවර

ආර්ථික ක්‍රියාකාරිත්වයට අගය එක් කිරීම මගින් ජාතික සංවර්ධනයට සුවිශේෂී දායකත්වයන් ලබා දීම පිණිස උචිත දැනුමෙන්, අත්‍යවශ්‍ය කුසලතාවලින්, ව්‍යවසායකත්ව හැකියාවන්ගෙන්, සාරධර්මවලින් හා ආකල්පයන් ගෙන් හෙබි සැමතින් පරිපූර්ණ හා පූර්ණ වශයෙන් රැකියානියුක්ත කළ හැකි තාක්ෂණතාන්ත්‍රික හා ව්‍යවසායික උපාධිධාරීන් බිහි කිරීම

3. උප කුලපතිතුමාගේ පණිවුඩය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ 14 වැනි විශ්වවිද්‍යාලය වශයෙන් 2005 ජූනි 01 දින ස්ථාපිත කරනු ලැබීය. එය රටෙහි ආර්ථික සංවර්ධනයේ අවශ්‍යතා සපුරාලනු පිණිස සහසම්බන්ධ වූ විශ්වවිද්‍යාලයක් ගොඩනැගීමේ සුවිශේෂී අත්හදාබැලීමක් වශයෙන් සැලකේ. ඒ අනුව එය ව්‍යවසායික කුසලතා හා නිපුණතාව සහිත උපාධිධාරීන් බිහි කිරීම අරමුණු කර ගත් නූතන අධ්‍යාපනික සංකල්පයන් සහිත, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල පද්ධතියෙන් වෙනස් විශ්වවිද්‍යාලයකි.

ජාතික සංවර්ධනය උදෙසා සඵලදායී ක්‍රියාමාර්ග ඉල්ලා සිටින සමාජයට අපගේ තරුණ ව්‍යාවසායකයින් මුහුණ දෙන අවස්ථාව වන විට විශේෂඥයින් වී සිටිය හැකි වන අයුරින් වඩාත්ම යහපත් මෙවලම්වලින් අපි ඔවුන් සන්නද්ධ කරමු. ඔවුහු මෙම සංකල්පයේ ඵලය සහ ශ්‍රී ලාංකික උසස් අධ්‍යාපන පද්ධතියේ නව අත්හදා බැලීමෙහි අවසන් නිෂ්පාදනය වෙති. අපට එම අත්හදා බැලීමෙහි ප්‍රතිඵලය සැබැවින්ම ඇගැයීමට ලක් කළ හැක්කේ එය ස්ථාපනය කොට වසර කීපයක් ගතව ඇති වර්තමානයේදී ය.

ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි, විශේෂ උපාධි සහ ව්‍යාපාර ආයතනික මෙන්ම අඛණ්ඩ අධ්‍යාපන වෙළඳපලවල් තුළ ආර්ථික සංවර්ධනය සඳහා විද්‍යාත්මක, තාක්ෂණික හා ව්‍යවසායික ප්‍රවේශයන් භාවිතා කිරීමෙහි සමත් පරිපූර්ණ නායකයින් බිහි කිරීම සඳහා දේශීය සම්පත් සමුදායට අගය එකතු කිරීම කෙරෙහි දැඩි අවධාරණයක්ද සහිතව පර්යේෂණය හා ඉගෙනීම කෙරෙහි මෙම විශ්වවිද්‍යාලය අවධානය යොමු කරයි.

ක්‍රියාකාරිත්ව සැලැස්ම සමග 2013-2018 කාලපරිච්ඡේදය සඳහා පිළියෙළ කරන ලද ආයතනික සැලැස්මේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. වර්ෂය මුළුල්ලේම ආයතනික සැලැස්ම සමාලෝචනය/නිරීක්ෂණය කිරීම පිණිස ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම විශ්වවිද්‍යාලයේ මුඛ්‍ය අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස සංවර්ධනය කරන ලද පහත මුඛ්‍ය ක්ෂේත්‍රයන් ආයතනික සැලැස්ම තුළ හඳුනා ගෙන ඇත:-

- ජාතික හා ගෝලීය අදාළත්වයක් සහිත විවිධ ක්ෂේත්‍රයන්හි විහිදුණු ගුණාත්මක ප්‍රථම උපාධි අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කිරීම
- උපාධි අපේක්ෂකයින්ට ව්‍යවසායත්ව කුසලතා ලබා දීම
- උපාධි අපේක්ෂකයින්ට ව්‍යවසායත්ව කුසලතාව ලබා දීම
- උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම
- උපාධිධාරීන්ගේ රැකියා නියුක්ත කළ හැකි බව පිළිබඳ විභවයන් දියුණු කිරීම
- උපාධි අපේක්ෂකයින්ගේ මෘදු කුසලතා දියුණු කිරීම
- ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා ඒවාට සහයෝගය දීම
- ගුණාත්මක පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් හඳුන්වා දීම
- කාර්ය මණ්ඩලයේ නිපුණතාවන් හා කැපවීම සංවර්ධනය කිරීම

ක්‍රියාකාරිත්ව සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු පිණිස පීඨ විසින්ම විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, උපාධි වැඩසටහනේ ගුණාත්මකතාව දියුණු කරනු පිණිස, පැවති වැඩසටහනේ විෂය නිර්දේශයන්ට ප්‍රතිශෝධන සහ නව චක්‍රලේඛ හඳුන්වා දීම දැනටමත් සිදු කර ඇත.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය හාත්පස විහිදී මනස්කාන්ත දර්ශනයක් සහිත කඳුකර භූමියක පිහිටි අක්කර 59 ක ඉඩමක් සිසාරා විහිදී තිබේ.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා ගෝලීය අවශ්‍යතාවන් පිරිමසාලන බහුවිධ උපාධි වැඩසටහන් ඉදිරිපත් කරන පීඨ තුනකින් සමන්විත ය.

1. සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය
    i. සත්ව විද්‍යා
    ii. අපනයන කෘෂිකර්ම
    iii. තේ තාක්ෂණය හා අගය එක් කිරීම
    iv. ජලජ සම්පත් හා තාක්ෂණ
    v. තාල හා ක්ෂීර තාක්ෂණ හා අගය එක් කිරීම

2. විද්‍යා හා තාක්ෂණවේද පීඨය
    i. විද්‍යා හා තාක්ෂණවේද
    ii. පරිගණක විද්‍යා හා තාක්ෂණවේද
    iii. කර්මාන්ත තොරතුරු තාක්ෂණවේද
    iv. ඛනිජ සම්පත් හා තාක්ෂණවේද

3. කළමනාකරණ පීඨය
    i. ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයන
    ii. ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර හා සිද්ධි පිළිබඳ කළමනාකරණ

ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සන්නිවේදන කුසලතා සංවර්ධනය කරනු පිණිස අනිවාර්ය වැඩසටහන් ක්‍රියාත්මක වේ. මෙහි උපාධි වැඩසටහන් තනි දෙපාර්තමේන්තු විසින් පිරිනමනු ලබන විෂයන්ට/පාඨමාලා මොඩියුලවලට සීමා නොවේ.

හොඳින් කළමනාකරණය කරනු ලබන හා ශිෂ්‍ය අධ්‍යයන කටයුතුවලට උචිත මනා පරිසරයකින් යුක්ත නේවාසිකාගාර පහසුකම්වලින් සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවකට සෙත සැලසුණි. නේවාසික විශ්වවිද්‍යාලයකට අවශ්‍ය වන සියලුම පහසුකම් සපයා දීම මගින් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් තුළ සංස්කෘතික හා ආචාරධර්ම පිළිබඳ සාරධර්ම ඇති කිරීම සම්බන්ධයෙන් හිතකාමී වටාපිටාවක් ඇති කිරීමට මෙම විශ්වවිද්‍යාලය යත්න දරයි. සියලුම විද්‍යාර්ථීන්ට සේවා කාණ්ඩ තුනක් සපුරාලීමට සිදු වේ. ඒවා නම්: අධ්‍යයන ක්‍රියාකාරකම්, පර්යේෂණ හා සංස්ථායික සාමාජීය වගකීම් කටයුතු ය.

විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයට බැඳෙන තරුණ විද්‍යාර්ථීන් පුහුණු කිරීමට ඇපකැප වී සිටී. අයවැය බාධකයන් නොතකා අධ්‍යයන කාර්ය මණ්ඩලයට පර්යේෂණ අරමුදල් ලබා දෙනු ලැබීය. තරුණ පර්යේෂකයින්ට සිය සොයා ගැනීම් පර්යේෂණ ප්‍රජාව වෙත ඉදිරිපත් කිරීම මගින් සිය වෘත්තිය අර්ඹනු පිණිස, ඔවුන්ගේ පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට හැකි වන සේ ඉතා කෙටි කාල පරිච්ඡේදයකට වරක් පර්යේෂණ සැසි පවත්වනු ලැබේ. මෙම විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සෘජුවම ජාතික සම්පත් සංවර්ධනයට හා සමාජ සුභසාධනයට දායක වේ.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර සියලූ කොටස්කරුවන්ට පැහැදිලි හා ප්‍රකට ය. එකිනෙකට වෙනස් ක්‍රියාකාරකම් සඳහා වූ වගකීම් භාරයන් ආයතනික සැලැස්ම තුළ පැහැදිලිව හඳුනා ගෙන තිබේ. විශ්වවිද්‍යාලය මූල්‍ය සම්පත් සඵලදායී ලෙස උපයෝගී කර ගනිමින් සිටී.

ආචාර්ය ජී. චන්ද්‍රසේන
උප කුලපති
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

4. මානව සම්පත් සහ ශිෂ්‍යයෝ

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ව විද්‍යාව	169	58	පීඨ තුන මෙන්ම පොදු පරිපාලනය සඳහා සේවය සලසන අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් පිළිවෙලින් 71 දෙනෙක් සහ 16 දෙනෙක් වෙයි.
	අපනයන කෘෂිකර්මය	159		
	තේ තාක්ෂණවේදය සහ අගය එක් කිරීම	149		
	ජලජ සම්පත් තාක්ෂණවේදය	166		
	තාල හා ක්ෂීර තාක්ෂණවේදය සහ අගය එක් කිරීම	152		
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණවේදය	175	55	
	පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය	201		
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය	169		
	ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය	151		
කළමනාකරණ	ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය	202	29	
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය	200		
එකතුව		**1893**	**142**	

5. ශිෂ්‍ය-ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිළිබඳ විස්තර

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සෑම වර්ෂයකදීම එක් එක් උපාධි වැඩසටහන සඳහා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 55 දෙනකු පමණක් බඳවා ගනී. ඔවුන් තෝරා ගනු ලබන්නේ අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල හා මෙම විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල පදනම් කර ගෙන ය.

පීඨය	අධ්‍යයන පාඨමාලාව	මාධ්‍යය	පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2011/2012 ශිෂ්‍ය කාණ්ඩය)	දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2010/2011 ශිෂ්‍ය කාණ්ඩය)	තුන්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2009/2010 ශිෂ්‍ය කාණ්ඩය)	සිවුවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව (2008/2009 ශිෂ්‍ය කාණ්ඩය)	උපාධිධාරීන් සංඛ්‍යාව (2007/2008 ශිෂ්‍ය කාණ්ඩය)
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ව විද්‍යාව	ඉංග්‍රීසි	47	44	37	41	36
	අපනයන කෘෂිකර්මය		45	38	37	39	38
	තේ තාක්ෂණවේදය සහ අගය එක් කිරීම		26	41	41	41	40
	ජලජ සම්පත් තාක්ෂණවේදය		36	40	42	48	-
	තාල හා ක්ෂීර තාක්ෂණවේදය සහ අගය එක් කිරීම		24	46	36	46	-
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණවේදය		51	43	46	35	38
	පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය		67	48	44	42	43
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය		40	45	45	39	41
	ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය		32	43	38	38	49
කළමනාකරණ	ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය		54	49	46	53	52
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය		57	47	48	48	-
එකතුව			**479**	**484**	**460**	**470**	**337**

අභිනව ශිෂ්‍ය කාණ්ඩයේ ස්ත්‍රී-පුරුෂ බෙදී යාම - 2013 (2011/2012 ශිෂ්‍ය කාණ්ඩය)



2013 වර්ෂය තුළ උපාධි ලැබූ ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ ස්ත්‍රී-පුරුෂ බෙදී යාම (2007/2008 ශිෂ්‍ය කාණ්ඩය)



6. අධ්‍යයන කාර්ය මණ්ඩලය

6.1. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර - 2013

පීඨය	විෂය ක්ෂේත්‍රය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	කථිකාචාර්ය(පරිවාස)	තාවකාලික කථිකාචාර්ය/ ප්‍රදර්ශක
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම	සත්ව විද්‍යාව	ඉංග්‍රීසි	-	-	02 (01)	04	26	25
	ජලජ සම්පත් තාක්ෂණවේදය							
	තේ තාක්ෂණවේදය සහ අගය එක් කිරීම							
	තාල හා ක්ෂීර තාක්ෂණවේදය සහ අගය එක් කිරීම							
	අපනයන කෘෂිකර්මය							
විද්‍යා හා තාක්ෂණවේද	විද්‍යාව හා තාක්ෂණවේදය		-	-	08	01	28	18
	පරිගණක විද්‍යාව හා තාක්ෂණවේදය							
	කර්මාන්ත තොරතුරු තාක්ෂණය							
	ඛනිජ සම්පත් සහ තාක්ෂණවේදය							
කළමනාකරණ	ව්‍යවසායකත්ව හා කළමනාකරණ අධ්‍යයනය		-	-	03	03	16	07
	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය							
	පුළුල් පොදු අධ්‍යාපන හා අත්‍යාවශ්‍ය කුසලතා	ඉංග්‍රීසි/ සිංහල / දමිළ						
එකතුව			**-**	**-**	**13 (01)**	**08**	**70**	**50**

තාවකාලික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංඛ්‍යාව වරහන් තුළ දී ඇත ()

`

6.2. පුස්තකාල කාර්ය මණ්ඩලය

කේ.එම්.ආර්.කේ. කුලතුංග මිය, බී.ඒ. (පේරාදෙණිය), දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉන්දියාව), එම්.එල්.අයි.එස්.සී. (දිල්ලි) - සහකාර පුස්තකාලයාධිපතිනි (2013.07.25 දින සිට අධ්‍යයන නිවාඩු ලබා සිටී.)

ඩී.පී.සී. විතාන මිය, - බී.එස්.සී. (ශ්‍රී ජයවර්ධනපුර) - සහකාර පුස්තකාලයාධිපතිනි

ටී. ප්‍රදීපන් මහතා, බී.ඉකෝන් (නැගෙනහිර විශ්වවිද්‍යාලය), එම්.එස්.සී. එල්.අයි. (ඉන්දියාව), මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉන්දියාව) - සහකාර පුස්තකාලයාධිපති (2013.12.01 දින සිට අධ්‍යයන නිවාඩු ලබා සිටී.)

7. පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය

7.1. පරිපාලන කාර්ය මණ්ඩලය

2013 වර්ෂය තුළ පරිපාලන කාර්ය මණ්ඩලයේ එක් එක් ප්‍රභේදය යටතේ සේවය සලසන සාමාජික සංඛ්‍යා පහත පරිදි වේ:-

ප්‍රභේදය	පිරිස් සංඛ්‍යාව
ලේඛකාධිකාරී	01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	03
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	03
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	01
සහකාර ලේඛකාධිකාරී	02
සහකාර මූල්‍යාධිකාරී	01
විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී	01
ව්‍යාපෘති කළමනාකාර (කොන්ත්‍රාත් පදනම)	01

මූල්‍යාධිකාරී, ප්‍රධාන ආරක්ෂක නිලධාරී හා ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ යන තනතුරු පුරප්පාඩු වී පැවතුණි.

7.2. උපකාරක කාර්ය මණ්ඩලය

තාක්ෂණික නිලධාරීන්ගේ සේවාවන් හැර අන් සියලුම ලිපිකාර හා ආශ්‍රිත ශ්‍රේණිවල සේවාවන් පුහුණුලාභීන් හරහා ලබා ගනු ලැබූ අතර ඔවුන් පසුව පැවරුම් පදනමින් මෙහෙයුම් සහකාරවරුන් ලෙස පත් කරන ලදී. පරිගණක ආශ්‍රිත කාර්යයන්, ලිපිකාර කාර්යයන්, මෙහෙයුම් කාර්යයන් හා ලේකම් කාර්යයන් ඇතුළු කර්තව්‍යන් රාශියක් මෙහෙයුම් සහකාරවරු ඉටු කරති. අපගේ විශ්වවිද්‍යාලයේ පරිපාලනය මෙහෙයුම් සාර්ථකත්වය ඉලක්ක කොට ගෙන මෙහෙයවනු ලබන අතර, මෙහෙයුම් සහකාරවරු සිය කුසලතා ප්‍රදර්ශනය කොට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපායෙහි සාර්ථකත්වය ඔප්පු කර ඇත.

සියලුම පත්වීම්ලාභීන් ඌව පළාතේම අය වන අතර, ඔවුහු විශ්වවිද්‍යාලය සමීපයේ පදිංචිව සිටිති. සියලු අනධ්‍යයන හා උපකාරක කාර්ය මණ්ඩල ප්‍රභේද හා සංඛ්‍යාවන් පහත දැක්වේ.

ප්‍රභේදය	සේවක සංඛ්‍යාව
තාක්ෂණික නිලධාරී	02
පරිගණක යෙදුම් සහකාර (CAA) (අනියම්)	04
මෙහෙයුම් සහකාර (OA) (පැවරුම් පදනම)	20
පුහුණුලාභී	43
ගබඩා භාරකාර	01
සරප්	01

තවද, උප ශිෂ්‍යාගාරාධිපතිවරුන් දෙදෙනකුගේ හා ක්‍රීඩා නිලධාරියකුගේ සේවාවන් බාහිර සේවා සම්පාදකයින් වෙතින් සපුරා ගන්නා ලදී.

7.3. උපකාරක කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති ආකාරය

පීඨය / ශාඛාව	වඩාත්ම ජ්‍යෙෂ්ඨ	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (මෙහෙයුම් සහකාර)	කණිෂ්ට කාර්ය මණ්ඩලය (පුහුණුලාභී)	සෙසු සේවකයෝ
උප කුලපති කාර්යාලය	-	1	01	
ලේඛකාධිකාරී කාර්යාලය	-	1	01	
සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය	-	04 (01**)	01	
විද්‍යා හා තාක්ෂණවේද පීඨය	-	03 (01**)	06	
කළමනාකරණ පීඨය	-	-	02	
ශිෂ්‍ය කටයුතු අංශය	-	03	03	
මානව සම්පත් අංශය	-	01	02	
පොදු පරිපාලන අංශය	-	03	01	කිසිවකුත් නැත
විභාග අංශය	-	03	05	
ප්‍රසම්පාදන අංශය	-	01	02	
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	-	02		
මූල්‍ය අංශය	-	(02***)	07	
පුස්තකාලය	-	01	10	
වෛද්‍ය මධ්‍යස්ථානය	-	01	-	
ව්‍යාපෘති	-	-	02	
එකතුව	-	**28**	**43**	

* මෙම විශ්වවිද්‍යාලය කිසිදු සුළු සේවකයෙක් බඳවා ගෙන නොමැත. සුළු සේවකයින්ගේ සේවාවන් සේවා සම්පාදකයින් වෙතින් ලබා ගනු ලැබීය.

**තාක්ෂණික නිලධාරීන් (2)

*** සරප් හා ගබඩා භාරකරු (2)

8. පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන

2013 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ පර්යේෂණ, නව්‍යකරණ හා ප්‍රකාශන

විෂයය	ප්‍රකාශිත සංඛ්‍යාව	වාණිජකරණය කරන ලද සංඛ්‍යාව	ඉදිරිපත් කරන ලද සංඛ්‍යාව
පර්යේෂණ අධ්‍යයන සංඛ්‍යාව	-	-	23
නව්‍යකරණ / නිපැයුම් සංවර්ධන සංඛ්‍යාව	-	-	-
ජර්නල ලිපි සංඛ්‍යාව	17	-	-
ග්‍රන්ථ/පරිච්ඡේද සංඛ්‍යාව	10	-	-
උද්ධෘත සංඛ්‍යාව	254	-	-
පෝස්ටර සංඛ්‍යාව	14	-	-
එකතුව	**295**	**-**	**23**

9. වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු

විෂයය	පිරිනමන ලද / සහභාගි වූ	සම්පූර්ණ කළ	ඉදිරිපත් කිරීම් කළ
උපාධි වැඩසටහන් සංඛ්‍යාව	11	11	-
සහතිකපත්‍ර වැඩසටහන් සංඛ්‍යාව	02	02	-
ප්‍රජා සේවා සම්පාදන වැඩසටහන් සංඛ්‍යාව	23	23	-
කාර්ය මණ්ඩල සංවර්ධන සම්මන්ත්‍රණ හා වැඩමුළු සංඛ්‍යාව	73	73	-
එකතුව	**109**	**109**	-

10. ලැබුණු සම්මාන ප්‍රදානයන් පිළිබඳ විස්තර

විෂයය	සම්මාන සංඛ්‍යාව	විද්වතුන් සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
දේශීය සම්මාන ප්‍රදානයන්	-	-	-
ජාත්‍යන්තර සම්මාන ප්‍රදානයන්	04	04	-
එකතුව	**04**	**04**	**-**

11. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

(රුපියල්)

විෂයය	2013	2012
අ. පුද්ගල පඩිනඩි	121,219,347	103,926,933
ආ. ගමන් වියදම්	1,957,928	306,598
ඇ. සැපයුම්	9,467,163	12,658,833
ඈ. නඩත්තුව	1,817,403	1,922,439
ඉ. ගිවිසුම්ගත සේවා	112,870,761	92,899,422
ඊ. වෙනත්	17,578,202	12,487,045
එකතුව	**264,910,804**	**224,201,270**

12. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

(රුපියල්)

විෂයය	2013	2012
අ. ගෘහභාණ්ඩ හා වෙනත් උපකරණ අත්කර ගැනීම	73,806,688	10,528,406
ආ. යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	2,447,744	55,781,073
ඇ. ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් අත්කර ගැනීම	184,604,627	112,810,708
ඉ. වෙනත්	2,978,366	1,930,696
එකතුව	**263,837,425**	**181,050,883**

13. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)

(රුපියල් මිලියන)

නම හා විස්තර	ණය/ ප්‍රදානය	අරමුදල් සම්පාදන ආයතනය	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව	RFA	DF
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම 1 හා 2 අදියර	-	-	3,420.00	-	✓
ඇඟළුම් කම්හල් ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම	-	-	53.96	-	✓
එකතුව	-	-	**3,473.96**	-	-

14. ව්‍යාපෘති වියදම පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල් සම්පාදිත)

(රුපියල්)

නම	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	2012 වර්ෂයේ වියදම (රුපියල් මිලියන)	2013 වර්ෂයේ වියදම (රුපියල් මිලියන)	2013.12.31 දිනට සමුච්චිත වියදම (රුපියල් මිලියන)	භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය (%)
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම 1 හා 2 අදියර	3,420.00	110.81	184.60	1,836.28	60%
ඇඟළුම් කම්හල් ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම	53.96	0.87	-	41.24	95%
එකතුව	**3,473.96**	**111.68**	**184.60**	**1,877.52**	**-**

15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

(රුපියල්)

විෂයය	2013 වර්ෂයේ ප්‍රතිපාදනය	2013 වර්ෂයේ වියදම	ඉතුරුම්/(අතිරික්ත වියදම)
අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන	335,749,000	264,910,805	70,838,195
ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	170,790,000	80,151,920	90,638,080
ඇ. ව්‍යාපෘතිය - දේශීය අරමුදල් සම්පාදිත	220,000,000	184,604,627	35,395,373
ඈ. ව්‍යාපෘතිය - විදේශීය අරමුදල් සම්පාදිත	-	-	-
එකතුව	**726,539,000**	**529,667,352**	**196,871,648**

16. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

(රුපියල්)

ආදායම් මූලාශ්‍රය	2013 වර්ෂයේ ප්‍රතිපාදන (රුපියල්)	2013 වර්ෂයේ රැස් වූ මුදල (රුපියල්)	හිඟය/අතිරික්තය (රුපියල්)
අ. ප්‍රථම උපාධි අධ්‍යයනය (නේවාසිකාගාර හා ලියාපදිංචි ගාස්තු ආදිය)	6,330,000	13,191,742	6,861,742
ආ. පශ්චාත් උපාධි අධ්‍යයනය	-	-	-
ඇ. උපදේශක සේවා (පුහුණුව, විභාග හා වෙනත්)	3,315,000	553,000	(2,762,000)
ඈ. වෙනත්	-	-	-
එකතුව	**9,645,000**	**13,744,742**	**4,099,742**

17. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2013

(රුපියල්)

විෂයය	සූත්‍රය	ඒක-ශිෂ්‍ය වියදම (රුපියල්)
අ. එක් ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම	පුනරාවර්තන වියදම - ශිෂ්‍ය සංඛ්‍යාව	139,942.32
ආ. එක් ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම	ප්‍රාග්ධන වියදම - ශිෂ්‍ය සංඛ්‍යාව	42,341.22
එකතුව		**182,283.53**

* (ක්ෂය හා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් වෙත මූල්‍ය සහායද ඇතුළුව)

18. 2013 වර්ෂයේදී ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් විස්තර	වියදම (රුපියල්)	භෞතික ප්‍රගතිය
ඩී. ඊ. හා එෆ්. ගොඩනැගිලි සඳහා ෆයිබර් ජාලය	1,266,259.16	80%
ඊ. ගොඩනැගිල්ල සඳහා ජාලය	19,279,637.95	90%
එෆ්. ගොඩනැගිල්ල සඳහා ජාලය	1,043,424.88	90%
ඩී. ගොඩනැගිල්ල සඳහා ජාලය	3,994,488.90	90%
නඩත්තු ගොඩනැගිල්ල	37,278.00	10%
ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිල නිවාස	26,412,699.50	80%
කාර්ය මණ්ඩල නිල නිවාස (ස්ටුඩියෝ මහල් නිවාසය)	38,064,917.35	80%
මාර්ග සහ භූමි අලංකරණය	16,573,803.63	60%
ආපන ශාලාව හා වැසිකිළි	11,932,152.68	90%
සනාතන මණ්ඩල ගොඩනැගිල්ල	60,957,125.25	40%
විශ්වවිද්‍යාල ආගන්තුක නිවාසය	1,458,838.92	90%

19. 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	2013 රුපියල්	2012 රුපියල්
වත්කම්		
ජංගම වත්කම්		
මුදල් හා මුදල් සම දේ	1,335,207	9,429,410
ලැබිය යුතු	14,534,698	19,245,531
පරිලේඛන	5,431,453	2,858,782
අත්තිකාරම්	198,262	96,000
	21,499,621	31,629,723
ජංගම නොවන වත්කම්		
ලැබිය යුතු	5,602,480	4,682,456
දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ	1,290,305,122	1,326,976,268
සිදු කෙරෙමින් ඇති වැඩ	365,641,418	181,036,791
ඉඩම් අත්කර ගැනීම	53,016,399	53,016,399
ගුණාත්මකතා වර්ධන ව්‍යාපෘති	1,206,090	-
	1,715,771,509	1,565,711,914
මුළු වත්කම්	1,737,271,130	1,597,341,638
බැරකම්		
ජංගම බැරකම්		
උපචිත වියදම්	39,129,463	7,839,588
විවිධ ණයහිමියෝ ආදීහු	111,221,850	99,909,803
	150,351,313	107,749,391
ජංගම-නොවන බැරකම්		
විලම්බිත ආදායම	133,457,306	107,596,853
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය	6,813,256	5,824,388
	140,270,561	113,421,241
මුළු බැරකම්	290,621,875	221,170,632
ශුද්ධ වත්කම්	1,446,649,255	1,376,171,005
ශුද්ධ වත්කම්/කොටස් හාරය		
සමුච්චිත අරමුදල	1,831,042,417	1,666,874,277
පොදු සංචිතය	(394,580,896)	(297,801,450)
විශේෂ සංචිතය	1,830,484	3,976,032
විශේෂ අරමුදල්	8,357,250	3,122,145
මුළු ශුද්ධ වත්කම්/ කොටස් හාරය	1,446,649,255	1,376,171,005

20. 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

	2013 රුපියල්	2012 රුපියල්
ආදායම		
පුනරාවර්තන ප්‍රදානය	203,000,000	233,700,000
ශිෂ්‍යාධාරය හා මහපොළ ප්‍රදාන	21,108,150	22,292,150
ස්වයං-මූල්‍යන වැඩසටහනේ ආදායම	553,000	1,791,277
වෙනත් ආදායම්	13,191,742	8,593,589
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	40,788,873	34,719,487
මුළු ආදායම	**278,641,766**	**301,096,502**
වියදම්		
පුද්ගල පඩිනඩි	121,219,347	103,926,933
ගමන් වියදම්	1,957,928	306,598
සැපයුම්	9,467,163	12,658,833
නඩත්තුව	1,817,403	1,922,439
ගිවිසුම්ගත වියදම	112,870,761	92,899,422
වෙනත් පුනරාවර්තන වියදම්	17,578,202	12,487,045
ස්වයං-මූල්‍යකරණ වැඩසටහනේ වියදම්	418,496	1,546,238
ශිෂ්‍යාධාර හා මහපොළ ගෙවීම්	21,108,150	22,292,150
ක්ෂය	115,616,976	108,628,465
මුළු වියදම්	**402,054,427**	**356,668,123**
අදාළ කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)	(123,412,661)	(55,571,620)

21. 2013 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2013 රුපියල්	2012 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් ඌණතාව/ අතිරික්තය	(123,412,661)	(55,571,620)
මුදල් - නොවන සංචලනයන්		
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(40,788,873)	(34,719,487)
ක්ෂය	115,616,976	108,628,465
ප්‍රතිපාදන හා වෙනත්	2,294,002	2,205,825
W/C වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	(46,290,557)	20,543,183
අයවිය යුතු මුදල් (වැඩි වීම)/ අඩු වීම (CA)	4,710,833	(3,851,417)
අයවිය යුතු මුදල් (වැඩි වීම)/ අඩු වීම (NCA)	(920,023)	(4,682,456)
පරිලේඛන (වැඩි වීම)/ අඩු වීම	(2,572,671)	1,985,325
අත්තිකාරම් (වැඩි වීම)/ අඩු වීම	(102,263)	1,509,352
උපචිත වියදම් වැඩි වීම/ (අඩු වීම)	31,289,875	(1,456,013)
විවිධ ණයහිමියෝ වැඩි වීම/ (අඩු වීම)	11,312,047	38,391,343
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහය වීම්	**(2,572,758)**	**52,439,317**
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය වීම්		
ස්ථාවර වත්කම් අත්කර ගැනීම	(264,756,547)	(181,050,883)
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහය වීම්	(264,756,547)	(181,050,883)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය වීම්		
සමුච්චිත අරමුදල	187,350,674	95,758,603
විලම්බිත ආදයම	66,649,326	40,241,396
වෙනත් අරමුදල්	5,235,103	369,666
පොදු සංචිතය	-	(4,875)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහය වීම්	**259,235,103**	**136,364,790**
මුදල් හා මුදල් සමාන දේ හි ශුද්ධ වැඩි වීම / (අඩු වීම)	(8,094,203)	7,753,224
කාලපරිච්ඡේදය මුලදී මුදල් හා මුදල් සමාන දේ	9,429,410	1,676,186
කාලපරිච්ඡේදය අගදී මුදල් හා මුදල් සමාන දේ	**1,335,207**	**9,429,410**

සටහන - 2013.12.31 දිනට බැංකු ශේෂයන්

බැංකුව	ගිණුම් අංකය	මුදල (රුපියල්)
ලංකා බැංකුව	3114820	55,152
ලංකා බැංකුව	3114828	51,746
මහජන බැංකුව	10100168384805	1,228,310
එකතුව		1,335,207

22. විගණකාධිපතිතුමාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } UV/BD/D/UWU/1/13/78

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 ජනවාරි 30 දින.

උපකුලපති
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවමි.

Uva Wellassa U
06 FEB 2015
Registrar's office

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :
1. ලේකම්- මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } UV/BD/D/UWU/ 1/13/78

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 ජනවාරි 30 දින.

උපකුලපති
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2014 ජුලි 23 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරිතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

02. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 නොසැසඳු පාලන ගිණුම්

2013 වර්ෂය සඳහා වූ ලැබිය යුතු ශිෂ්‍යාධාර සහ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 3,611,200 ක් වන අතර එය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනයේ රු. 3,781,521 ක් ලෙස දැක්වීමෙන් රු. 170,321 ක වෙනසක් නිරික්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2007/2008 හා 2008/2009 අධ්‍යයන වර්ෂවලදී නේවාසිකාගාරවල පදිංචිව සිටි අවසන් වසර විභාගයට පෙනී සිටීමෙන් පසු විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ සිසුන් 98 දෙනෙකුගෙන් අයවිය යුතු නේවාසිකාගාර ගාස්තු රු. 59,870 ක් සහ අධිභාර රු. 365,677 ක් 2014 මැයි 26 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් මෙම විශ්වවිද්‍යාලයට ස්ථාන මාරුවී පැමිණි මහාචාර්යවරයෙකු වෙත 2011 ජනවාරි සිට ජුලි දක්වා වූ කාලය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවා තිබුණු රු. 93,546 ක පර්යේෂණ දීමනා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් අයකර ගෙන නොතිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට රු. 6,753,253 ක්වූ ආපදා ණය ශේෂය තුළ 2007,2008 හා 2010 වර්ෂවලදී නිලධාරීන් තිදෙනෙකු වෙත ලබාදුන් එකතුව රු. 238,275 ක ආපදා ණය ශේෂයක් 2013 දෙසැම්බර් 31 දිනටද අයකර ගෙන නොතිබුණි.

(iv) මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු. 108,000 ක්වූ උත්සව අත්තිකාරම් ණය ශේෂය තුළ 2010 , 2011 හා 2013 වර්ෂවල අප්‍රේල් මාසවලදී ලබාදුන් රු.11,000 ක උත්සව අත්තිකාරම් ණය ශේෂ අය නොවී පවතින බව නිරීක්ෂණය විය.

2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් ශේෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
	රු.	
ලැබිය යුතු ආරක්ෂක තැන්පත්	3,325,000	ඇප බැඳුම්කර
සේවක ඇප	50,000	සේවක ඇප ලේඛනය/ විස්තරාත්මක උපලේඛන

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි ආදියට යොමුව	විස්තරය
(අ) 1971 අංක 38 දරන මුදල් පනත 14 (1) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 71	2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවේ නොමැති 'මෙහෙයුම් සහකාර' තනතුර සඳහා කාර්ය පැවරුම් පදනම මත සේවකයින් බඳවාගෙන තිබුණ අතර යථෝක්ත කාල පරිච්ඡේදය තුළදී එම සේවකයන් සඳහා ගාස්තු වශයෙන් රු. 26,111,450 ක මුදලක් ගෙවා තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 135(1)	ඵලදායි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම සඳහා වැටුප් සකස් කිරීමේ ක්‍රියාවලිය නිලධාරීන් කිහිපදෙනෙකු අතර බෙදී යන ආකාරයට වගකීම් පවරා නොතිබූ අතර වැටුප් සකස් කිරීම හා ගෙවීම් කිරීමේ කටයුතු සරප් විසින්ම සිදුකර තිබුණි.
(iii) මුදල් රෙගුලාසි 320	2010 ජූනි 30 දින මිලදී ගෙන තිබූ රු. 258,048 ක් වටිනා ගිනි ආරක්ෂණ සේප්පු 04 ක යතුරු අස්ථාන ගතවී තිබුණ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2002 නොවැම්බර් 28 සහ IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු. 1,577,800 ක් වටිනා පරිගණක හා උපාංග පරිගණක වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.
(ඈ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/2009(2) හා 2009 සැප්තැම්බර් 01 දිනැති චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.
(ඉ) 2003 ජූනි 03 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ යහපාලනය පිළිබඳව උපදෙස් මාලාවෙහි 7 පරිච්ඡේදයෙහි 7.1 හා 7.2 ඡේදය	විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල ඌනතාවය රු.123,412,661 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.55,571,620ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයේ රු.67,841,041 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ස්වයං මූල්‍ය වැඩසටහන් ආදායම් නොලැබීම, පුද්ගල පාරිශ්‍රමික, ගමන් වියදම්, ගිවිසුම්ගත සේවා වියදම් හා ස්ථාවර වත්කම් ක්ෂය වැඩිවී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 1423 දෙනෙකුගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් වැය කරන ලද පිරිවැය රු.401,635,931 ක්වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු.282,246 ක් විය. ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 1787 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු.355,121,855 ක්වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු.198,725ක් විය. මේ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.83,521 කින් හෙවත් සියයට 42 ක වැඩිවීමකි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට බඳවා ගත් සිසුන් 538 දෙනෙකුගෙන් සිසුන් 59 දෙනෙකු එනම් සියයට 11 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ දිවයිනේ විශ්වවිද්‍යාලවල 1:18 ක්වූ සාමාන්‍ය කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතයට සාපේක්ෂව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතය 1:14 ක් විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ජූනි සිට 2013 දෙසැම්බර් දක්වා සෑම මාසයකම බාහිර පාඨමාලා වලින් ඉපයූ ආදායමෙන් රුපියල් ලක්ෂ 10 ක් පොලී ලැබීමක් නොමැතිව බැංකු ජංගම ගිණුමක නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2013 වර්ෂයේ කථිකාචාර්යවරුන් 14 දෙනෙකු හා ආධුනික කථිකාචාර්යවරුන් 87 දෙනෙකු සේවයේ නියුක්තව සිටි නමුත් ප්‍රතිපාදිත පර්යේෂණාධාර උපයෝගී කරගෙන පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර තිබුණේ ආචාර්යවරුන් 15 දෙනෙකු පමණි. මේ අනුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණක් වූ පර්යේෂණ පැවැත්වීම දිරිගැන්වීමට පර්යේෂණ කමිටුව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

4.3 අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011,2012 සහ 2013 වර්ෂවලදී අභ්‍යන්තර පර්යේෂණ සඳහා වාර්ෂික අයවැය ලේඛණය මඟින් වෙන්කළ පුනරාවර්තන ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 50, සියයට 80 සහ සියයට 54ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) පර්යේෂණ දිරිමත් කිරීම සඳහා 2013 වර්ෂයේදී අයවැයගත මූලධන ප්‍රතිපාදනය වූ රු. 1,790,000න් උපයෝජනය කර තිබුනේ රු. 362,170ක් පමණි. ඒ අනුව රු. 1,427,830 ක ප්‍රතිපාදන ඉතිරියක් වී තිබූ අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 80ක් විය.

4.4 නිෂ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජුනි 30 දින මිලදීගෙන තිබූ රු.322,560 ක් වටිනා ගිනි ආරක්ෂණ සේප්පු 05 ක් 2013 දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩහල සඳහා මිලදී ගෙන තිබූ රු. 14,060,480 ක් වටිනා 3-Axis CNC යන්ත්‍රය 2013 දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) මූලාකෘති සංවර්ධන විද්‍යාගාරය සඳහා ඉදිකළ ගොඩනැගිල්ල වර්ෂ 02ක සිට අභ්‍යන්තර ක්‍රීඩාගාරයක් ලෙස භාවිතයට ගෙන තිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාර 2006 සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා දායක මුදල් නියමිත දිනවලදී නොගෙවීම නිසා රු. 1,765,472 ක අධිභාර මුදලක් සහ සේවකයන්ගේ වැටුපෙන් අඩුකළ යුතු සියයට 8 ක දායකය වශයෙන් රු. 1,439,044 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවා තිබුණි.

(ආ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට 2006 සිට 2012 ජනවාරි දක්වා අර්ධ වාර්ෂික වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම හා දායක මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු. 193,816 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

4.6 ඉටු නොකළ ව්‍යාපෘති

2010 වැඩ ආරම්භ කර 2011 වර්ෂයේ වැඩ නිමකළ යුතු පහත සඳහන් ව්‍යාපෘති 2013 දෙසැම්බර් 31 දිනටද ආරම්භ කර නොතිබුණි.

ඉදිකිරීම් වැඩ	වැඩ ආරම්භකළ යුතු දිනය	වැඩ නිමකළ යුතු දිනය	වටිනාකම
			රු.
පල්දෝරු පද්ධතිය	2010.08.16	2011.08.15	17,800,000
වැසි ජලය අපහරණ පද්ධතිය	2010.08.02	2011.01.28	23,190,000

4.7 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 07 ක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 48 ක් සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිවාස කථිකාචාර්ය තනතුරු අනුමත සංඛ්‍යාව 69ක් හා තථ්‍ය සංඛ්‍යාව 87ක් වීමෙන් තනතුරු 18ක් අතිරික්තව තිබුණි.

(ඇ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ vi වන කොටසේ 33 වන වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර සඳහා සහ මූල්‍යාධිකාරී තනතුර සඳහා 2006 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 211න් 89ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 126 න් තනතුරු 83ක් සම්පූර්ණ කර නොතිබුණි.

(ඉ) ලිපිකාර ඒකාබද්ධ සේවයට සම්බන්ධ පරිගණක යෙදවුම් සහායක පුරප්පාඩු 27ක් සඳහා බඳවා ගැනීම් සිදු නොකර විශ්වවිද්‍යාල අනුමත සේවක සංඛ්‍යාවේ නොමැති තනතුරක් වන මෙහෙයුම් සහකාර තනතුර සඳහා 2005 වර්ෂයේ සිට පැවරුම් පදනම් මත වරින් වර සේවකයන් බඳවාගෙන තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට එලෙස සේවයේ යොදවා සිටි මෙහෙයුම් සහායකයින් සංඛ්‍යාව 21කි.

05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ.21 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2014 මැයි 07 දින දීය. විගණන නිරීක්ෂණයන්ගෙන් අනතුරුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 11 දින හා 2014 නොවැම්බර් 21 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි 01 දිනැති අංක 79/25 හා 79/24 පාලක සභා තීරණ අනුව අනුමත කරන ලද විශ්වවිද්‍යාලයේ 2013 සිට 2017 කාලපරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මේ හා 2013 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති 12 ක ප්‍රමාණාත්මක බැහැරවීම් දක්නට තිබුණි.

(ආ) 2013 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලස්මෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම, ඉටුකර ගතයුතු ඉලක්කයන්ගේ මූල්‍යමය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතිය මැනබැලීම සඳහා කාර්යසාධන වාර්තා දෙවන කාර්තුවේ සිට සකස් කර නොතිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මෙහෙයුම් සහයකයන් දෙදෙනෙකු විසින් 2013 වර්ෂයේ අභ්‍යන්තර විගණන කටයුතු ඉටුකරනු ලැබූ අතර ස්ථිර පලපුරුදු කාර්ය මණ්ඩලයක් යොදවාගෙන නොතිබුණි.

5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) හා 4.2.2 ඡේද ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණ අතර ප්‍රසම්පාදන කාල සැලැස්මක්ද සකස් කර නොතිබුණි.

5.6 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් මූලධන වියදම් සඳහා ලබාදී තිබුණ රු. 390,790,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු. 126,033,453 ක් ඉතිරිකර තිබුණි. එය සමස්ථ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 32 කි.

(ආ) ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 05ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 23 සිට සියයට 81 දක්වා වූ විචලනයක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබුණ ප්‍රතිපාදනවලින් සියයට 23 සිට සියයට 96 දක්වා වූ සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.8 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2012 සැප්තැම්බර් 21 දින පැවැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීමට මේ දක්වා විශ්ව විද්‍යාලය අපොහොසත්ව තිබුණි.

5.9 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය

2010 ඔක්තෝබර් 05 දිනට ජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. 23,190,000 ක මුදලකට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය වෙත පිරිනමා තිබුණි. 2011 ජනවාරි 03 දින ඉදිකිරීම් නිමකර විශ්වවිද්‍යාලය වෙත භාරදී තිබුණු මෙම ව්‍යාපෘතිය අසාර්ථක බැවින් නැවත පුනරුත්ථාපය කිරීම මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය විසින් 2013 ජුනි ආරම්භ කර තිබු නමුත් අදාල කාර්යයන් අතරමඟ ඇණහිට තිබුණි. එබැවින් වර්තමානයේ ජලය පිරිපහදු නොකර පරිසරය වෙත මුදාහරිනු දක්නට ලැබුණි.

06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ගබඩා පාලනය
(ඇ) මූල්‍ය කළමනාකරණය හා වියදම් පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

23. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ මතු කෙරුණු කරුණුවලට පිළිතුරු

විගණන නිරීක්ෂණය	අදහස් දැක්වීම
2.1 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** --	
2.2.1 **නොසැසඳූ පාලන ගිණුම්** ---------------------------- 2013 වර්ෂය සඳහා වූ ලැබිය යුතු ශිෂ්‍යාධාර සහ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 3,611,200 ක් වන අතර එය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනයේ රු. 3,781,521 ක් ලෙස දැක්වීමෙන් රු. 170,321 ක වෙනසක් නිරීක්ෂණය විය.	2013 වර්ෂය සඳහා ලැබිය යුතු ශිෂ්‍යාධාර විස්තර පහත දැක්වේ. **ශිෂ්‍යාධාර** ලැබූ දිනය 2014.01.08 (ගෙවූ කාලය 2013 සැප්-නොවැ) 1,314,300.00 2014.05.19 (ගෙවූ කාලය 2013 දෙසැම්බර්) 931,100.00 පළමු වසර සිසුන් සඳහා ගෙවූ අත්තිකාරම් 1,536,121.00 **එකතුව** **3,781,521.00**
2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ------------------------------------- පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. i. 2007/2008 හා 2008/2009 අධ්‍යයන වර්ෂ වලදී නේවාසිකාගාරවල පදිංචිව සිටි අවසන් වසර විභාගයට පෙනී සිටීමෙන් පසු විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ සිසුන් 98 දෙනෙකුගෙන් අයවිය යුතු නේවාසිකාගාර ගාස්තු රු. 59,870 ක් සහ අධිභාර රු. 365,677 ක් 2014 මැයි 26 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2007/2008 වසරේ සිසුන් දහතුන්දෙනා 2012 උපාධි ප්‍රධානෝත්සවයට තේරී නොමැති අතර 2013 උපාධි ප්‍රධානෝත්සවයට සිසුන් අටදෙනෙකු තේරී ඇති අතර උපාධි ප්‍රධානෝත්සවයට සහභාගී වීමට පෙර අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි සිසුන්ගෙන් නේවාසිකාගාර ගාස්තු හා ඊට අදාල දඩමුදල් ගෙවන ලෙස ලිපි මගින් දැනුම් දී එම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.
ii. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් මෙම විශ්වවිද්‍යාලයට ස්ථාන මාරු වී පැමිණි මහාචාර්යවරයෙකු වෙත 2011 ජනවාරි සිට ජූලි දක්වා වූ කාලය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවා තිබුණු රු. 93,546 ක පර්යේෂණ දීමනා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් අයකර ගෙන නොතිබුණි.	අදාල මුදල නිරවුල් කරන ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත සිහි කැඳවුම් පත් යවා ඇත.

iii. 2013 දෙසැම්බර් 31 දිනට රු. 6,753,253 ක්වූ ආපදා ණය ශේෂය තුළ 2007,2008 හා 2010 වර්ෂ වලදී නිළධාරීන් තිදෙනෙකු වෙත ලබාදුන් එකතුව රු. 238,275 ක ආපදා ණය ශේෂයක් 2013 දෙසැම්බර් 31 දිනට ද අයකර ගෙන නොතිබුණි.	ආපදා ණය මුදල් ලබාගත් කථිකාචාර්ය ඒ.සී. වීරසූරිය මහත්මිය මියගොස් ඇති අතර විශ්වවිද්‍යාලය සේවක අරමුදල් මගින් එය පියවා ගැනීමට කටයුතු යොදා ඇත. අදාල ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව වෙත ඉදිරිපත් කොට ඇත. පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ කථිකාචාර්ය කේ.ඒ.ජී.සී. කහඳව මහතා නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ඔහුගේ සේවය අවසන් කිරීමට කටයුතු යොදා ඇත. ඔහු විසින් ලබාගත් ආපදා ණය මුදල පියවන ලෙස ලිඛිතව දැනුම් දී ඇත.
iv. මූල්‍ය ප්‍රකාශන අනුව 2013දෙසැම්බර් 31 දිනට රු. 108,000 ක්වූ උත්සව අත්තිකාරම් ණය ශේෂය තුළ 2010,2011 හා 2013 වර්ෂ වල අප්‍රේල් මාස වලදී ලබාදුන් රු. 11,000 ක උත්සව අත්තිකාරම් ණය ශේෂ අය නොවී පවතින බව නිරීක්ෂණය විය.	විවිධ හේතූන් මත සේවය අවසන් කොට ඇති පහත සඳහන් කාර්යය මණ්ඩල සාමාජිකයින් ලබාගත් උත්සව අත්තිකාරම් මේ දක්වා පියවා නොමැත. ඩී.ඩී.ටී. මධුෂානි, ආර්.ඩී.එම්.පී. පල්ලියගේ, ඩී.එම්.ආර්.කේ. දිසානායක යන අය හට අදාල ණය මුදල් පියවන ලෙසට ලිඛිතව දැනුම් දී ඇත.
2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම --- ගිණුම් ශේෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.	
<u>ගිණුම් විෂය</u> / <u>වටිනාකම</u> / <u>ඉදිරිපත් නොවූ සාක්ෂි</u>	
ලැබිය යුතු ආරක්ෂක තැන්පත් / 3,325,000 / ඇප බැඳුම්කර	ඇප බැඳුම්කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
සේවක ඇප / 50,000 / සේවක ඇප ලේඛනය/ විස්තරාත්මක උපලේඛන	ඒස්. සිවපාලන් (මුදල් අයකැමි) රු. 25,000 පී. අත්තනායක (ගබඩා භාරකරු) රු. 25,000
2.5 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම -- පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.	

(අ) 1971 අංක 38 දරන මුදල් පනත 14 (1) වගන්තිය	සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂික කෙටුම්පත් වාර්තා සකස් කර ඇති අතර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
(i) මුදල් රෙගුලාසි 71	2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවේ නොමැති 'මෙහෙයුම් සහකාර' තනතුර සඳහා කාර්ය පැවරුම් පදනම මත සේවකයින් බඳවාගෙන තිබුණ අතර යථෝක්ත කාල පරිච්ඡේදය තුළදී එම සේවකයන් සඳහා ගාස්තු වශයෙන් රු. 26,111,450 ක මුදලක් ගෙවා තිබුණි.	වර්ෂ 2006 සිට විශ්වවිද්‍යාලය සඳහා මෙහෙයුම් සහකාර නමින් තනතුරක් ඇති කරන ලෙස ඉල්ලීම් කොට තිබු අතර විශ්වවිද්‍යාලය විසින් පාලක සභාවේද එකඟතාවය මත එම තනතුර ලබාදෙන ලෙස දිගින් දිගටම ඉල්ලීම් කර ඇත. එසේ ඉල්ලීමට හේතුවී ඇත්තේ මෙම විශ්වවිද්‍යාලය අතිකාල දීමනා නොමැති, සති අන්ත දීමනා නොමැති, වෘත්තීය සංගම් වැනි කටයුතු සහ වෙනත් කිසියම් අසහනකාරී, කළබලකාරී, තත්ත්වයක් නොමැති සේවා ස්ථානයක් ලෙස පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සහ විශ්වවිද්‍යාලය හා බැඳී පවතින අයගේ අවශ්‍යතාවයක් වූ නව මුහුණුවරක විශ්වවිද්‍යාලයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ද ඇති බැවිනි. එම හේතුව නිසා පාලක සභාවේද එකඟතාවය මත සියළුම අනධ්‍යයන කාර්යය මණ්ඩලය තාවකාලික හා පුහුණු වශයෙන් බඳවා ගැනීමට කටයුතු කරතිබු අතර එය ඉතා ඵලදායී විය. මෙම උපක්‍රමය තුළින් විශ්වවිද්‍යාලයේ කටයුතු වඩාත් සාර්ථකව හා ඵලදායිකත්වයෙන් යුක්තව පවත්වාගෙන යාමට හැකිවනු ඇති බවට නිරීක්ෂණය කිරීමට කැමැත්තෙමු. විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවේ ඇති පරිගනක යෙදවුම් සහකාර සහ ලිපිකරු තනතුරු ප්‍රමාණයට අඩු සේවක සංඛ්‍යාවක් මෙහෙයුම් සහකරුවන් ලෙස තාවකාලික පදනම මත සේවයේ යොදවා ඇත. ඔවුන් විසින් විශ්වවිද්‍යාලයේ සහයක කටයුතු සියල්ල (සාමාන්‍ය පරිපාලන, විභාග, මානව සම්පත්, මිලදී ගැනීම්, මුදල්, විගණන, පුස්තකාල, පීඨ සහයක සේවාවන්, වෛද්‍ය මධ්‍යස්ථාන,) අනුමත සේවක සංඛ්‍යාවට වඩා අඩු ප්‍රමාණයකින් විශ්වවිද්‍යාලයේ කටයුතු සිදුකිරීම තුළින් රජයේ වියදම් අඩු කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.

(ii) මුදල් රෙගුලාසි 135(1)	ඵලදායී අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීම සඳහා වැටුප් සකස් කිරීමේ ක්‍රියාවලිය නිළධාරීන් කිහිපදෙනෙකු අතර වැටුප් සකස් කිරීම හා ගෙවීම් කිරීමේ කටයුතු සරප් විසින්ම සිදුකර තිබුණි.	පහත සඳහන් පරිදි වැටුප් සකස් කිරීමේ කටයුතු සිදු කරනු ලබනු ඇත. 1. වැටුප් සකස් කිරීම - මෙහෙයුම් සහකාර 2. පරීක්ෂා කිරීම - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (වැටුප්) 3. නිර්දේශ කිරීම - ලේඛකාධිකාරි 4. අනුමත කිරීම - උපකුලපති 5. සහතික කිරීම - මූල්‍යාධිකාරී
(iii) මුදල් රෙගුලාසි 320	2010 ජූනි 30 දින මිලදී ගෙන තිබු රු. 258,048 ක් වටිනා ගිනි ආරක්ෂණ සේප්පු 04 ක යතුරු අස්ථානගතවී තිබුණ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසී ප්‍රකාරව කටයුතු කර නොතිබිණි.	2010 ජූනි 30 දින විශ්වවිද්‍යාල අවශ්‍යතාව මත ගිනි ආරාක්ෂක සේප්පු 05 ක් මිලදි ගන්නා ලද අතර එය ගබඩාව මඟින් භාර ගන්නා ලදි. කෙසේ නමුත් ඒවා අදාල අංශ වෙත ස්ථාන ගත කර නොතිබුණි. මෙම ආරාක්ෂක සේප්පුඅධික බර හේතුවෙන් ඒවා ප්‍රවාහනය සඳහා සපයන ලද ආයතනය එක් අඩියක් එසවීම සඳහා රු. 400.00 ක පමණ මුදලක් ඉල්ලා සිටින ලදි. ඒ හේතුවෙන් ලේඛකාධිකාරිතුමිය ප්‍රකාශ කර සිටියේ පරිපාලන ගොඩනැගිල්ලේ බිම් මහලේ (පැරණි පුස්ථකාලය තිබු ස්ථානය) තැන්පත් කරන ලෙසටය. එම නිසා පිරිසිදු කරන ආයතනයෙන් සපයා දුන් සේවකයන් යොදවා කිසිදු මුදලක් වැය නොකොට එම සේප්පු 5 පැරණි පුස්ථකාල ගොඩනැගිල්ලට රැගෙන එන ලදි. නමුත් එයින් 04 ක යතුරු අදාල දෙපාර්තමේන්තු වෙත භාර නොදීම හේතුවෙන් මේ වන තෙක් ප්‍රයෝජනයට ගෙන නොමැත. පසුගිය විගණන කමිටුව තීරණය කර තිබුණේ මේවා නියමිත ස්ථාන වෙත යොමු කර භාවිතයට ගැනීමට නොහැකි නම් මේවා මිලදි ගත් ආයතනයට භාර දි යකඩ අල්මාරි මෙම මුදලට සරිලන ප්‍රමාණයට ලබා ගන්නා ලෙසයි.
(ඇ) 2002 නොවැම්බර් 28 සහ IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.1,577,800 ක් වටිනා පරිගණක හා උපාංග පරිගණක වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.	පරිගණක හා උපාංග ඇතුළත් වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA /2009 (2) හා 2009 සැප්තැම්බර් 01 දිනැති චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි	ස්ථාවර වත්කම් ලේඛණය විගණනය සඳහා භාර දී ඇති අතර එහි ඇති අඩුපාඩු පෙන්වා දුන් පරිදි නිවැරදි කිරිමට කටයුතු කරමි.
(ඉ) 2013 ජුනි 03 දිනැති අංක පී.ඊ.ඩී/12 රාජ්‍යය ව්‍යාපාර චක්‍රලේඛයේ යහපාලනය පිළිබඳ උපදෙස් මාලාවෙහි 7 පරිච්ඡේදයෙහි 7.1 හා 7.2 ඡේදය	විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබිණි.	ක්ෂේත්‍ර කිහිපයක් සඳහා මෙහෙයුම් උපදෙස් සකස් කොට ඇති අතර අනෙකුත් ක්ෂේත්‍ර සඳහා මෙහෙයුම් අත්පොත් පිළියෙල කිරීමේ කටයුතු සිදුකරමින් පවති.

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 1423 දෙනෙකුගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දරන ලද පිරිවැය රු. 401,344,436 ක්වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු. 282,041 ක් විය. ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 1787 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු. 355,121,855 ක්වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු. 198,725ක් විය. මේ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.83,316 කින් හෙවත් සියයට 42 ක වැඩිවීමකි.	2011/2012 ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම ප්‍රමාද වීම හේතු කොටගෙන ලියාපදිංචි මුළු ශිෂ්‍යය සංඛ්‍යාව පෙර වර්ෂය හා සැසඳීමේදී අඩුවී ඇත. එමෙන්ම පෙර වර්ෂයට සාපේක්ෂව කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා, ආරක්ෂක සේවා ඇතුළු අනෙකුත් පුනරාවර්ථන වියදම් ඉහල යාම මත ඒක ශිෂ්‍ය පිරිවැය පෙර වර්ෂයට වඩා වැඩි වී ඇත.
(ආ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයට බඳවාගත් සිසුන් 538 දෙනෙකුගෙන් සිසුන් 59 දෙනෙකු එනම් සීයයට 11 ක් පාඨමාලා හැර ගොස් තිබුනි.	සිසුන්ගේ පෞද්ගලික හේතූන් මත පාඨමාලා හැර ගොස් ඇති බව දන්වමි.
(ඇ) 2013 වර්ෂයේ දිවයිනේ විශ්වවිද්‍යාල වල 1:18 ක්වූ සාමාන්‍ය කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතයට සාපේක්ෂව ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට කථිකාචාර්ය ශිෂ්‍යය අනුපාතය 1:14 ක් විය.	අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවට අනුකූලව අධ්‍යයන කාර්යය මණ්ඩලය බඳවා ගෙන ඇත. එසේ වුවත් තෝරා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව විවිධ හේතූන් මත ලියාපදිංචි නොවීම හා ලියාපදිංචි වූ සිසුන් අනෙකුත් විශ්වවිද්‍යාල වල පාඨමාලා වල තේරී පත්වීම හේතු කොට ගෙන ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවී ඇත. කෙසේ නමුත් ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි වනු ඇත.

4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා -- පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. (අ) 2013 ජුනි සිට 2014 අප්‍රේල් දක්වා සෑම මාසයකම බාහිර පාඨමාලා වලින් ඉපයූ ආදායමෙන් රු. ලක්ෂ 10 ක් පොලී ලැබීමක් නොමැතිව බැංකු ගිණුමක නිශ්කාර්ෂව පැවතුණි.	බාහිර පාඨමාලා ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් රඳවාගෙන ඉතිරි මුදල් කෙටිකාලීන ආයෝජනයන්හි යෙදවීමට කටයුතු කරමි.
(ආ) 2013 වර්ෂයේ කථිකාචාර්යවරුන් 14 දෙනෙකු හා ආධුනික කථිකාචාර්යවරුන් 87 දෙනෙකු සේවයේ නියුක්තව සිටි නමුත් ප්‍රතිපාදිත පර්යේෂණාධාර උපයෝගී කරගෙන පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර තිබුනේ අචාර්යවරුන් 15 දෙනෙකු පමණි. මේ අනුව විශ්ව විද්‍යාලයේ ප්‍රධාන අරමුණක් වූ පර්යේෂණ පැවැත්වීම දිරිගැන්වීමට පර්යේෂණ කමිටු ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	කථිකාචාර්යවරු විසින් කරන ලද පර්යේෂණ වාර්තා සහ ප්‍රකාශන පිළිබඳ විස්තර 2013 වාර්ෂික වර්තාවේ අතුළත් කොට ඇත. විශ්ව විද්‍යාල අරමුදල් භාවිතා කරමින් කරන ලද පර්යේෂණ ප්‍රමාණය අඩුවීමක් දක්නට ලැබුන ද ඔවුන්ගේ පෞද්ගලික අරමුදල් සහ වෙනත් ආයතන සමඟ ඒකාබද්ධව සැළකිය යුතු පර්යේෂණ ප්‍රමාණයක් සිදුකර ඇති බව සඳහන් කරමි.
4.3 අරමුදල් උපයෝජනය ------------------------------ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. (අ) 2011, 2012 සහ 2013 වර්ෂ වලදී අභ්‍යන්තර පර්යේෂන සඳහා අයවැය මගින් වෙන්කළ පුනරාවර්තන ප්‍රතිපාදන වලින් පිළිවෙලින් සියයට 50 ක්, 80 ක් සහ 54 ක් උපයෝජනය කර නොතිබුණි.	2012 වසර හා සැසඳීමේදී කරන ලද පර්යේෂණ 2013 වසරේ ඉහළ යාමක් පෙන්නුම් කරනු ලැබේ. පවතින විද්‍යාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම මත වෙන් කරන ලද ප්‍රතිපාදන සියල්ල උපයෝජනය කිරීමට නොහැකි වී ඇත.
(ආ) පර්යේෂණ දිරිමත් කිරීම සඳහා 2013 වර්ෂයේදී අයවැයගත මූලධන ප්‍රතිපාදනය වූ රු. 1,790,000 න් උපයෝජනය කර තිබුනේ රු. 362,170 ක් පමණි. ඒ අනුව රු. 1,427,830 ක ප්‍රතිපාදන ඉතිරියක් වී තිබූ අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 80 ක් විය.	ඉහත 4.3 හි (අ) පිළිතුර අදාළ වේ
4.4 නිෂ්ක්‍රීය ඌණ උපයෝජිත වත්කම් -- පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. (අ) 2010 ජුනි 30 දින මිලදී ගෙන තිබූ රු. 322,560 ක් වටිනා ගිනි ආරක්ෂණ සේප්පු 05 ක් 2013 දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.	මෙම නිරික්ෂණය පිළිගන්නා අතර (ඇ) III පිළිතුරෙහි සඳහන් ආකාරයට යකඩ අල්මාරි සමඟ හුවමාරු කිරිමට අවශ්‍ය කටයුතු කරමි.

(ආ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩහල සඳහා මිලදී ගෙන තිබූ රු. 14,060,480 ක් වටිනා 3-Axis CNC යන්ත්‍රය 2013 දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව තිබුනි.	ඉංජිනේරු වැඩහල භාරව කටයුතු කරන කථිකාචාර්යවරයා විසින් මේ සම්බන්ධයෙන් දෙන ලද පිළිතුර අමුණුම් අංක 01 වශයෙන් ඉදිරිපත් කරමි.
(ඇ) **මූලාකෘති** සංවර්ධන විද්‍යාගාරය සඳහා ඉදිකල ගොඩනැගිල්ල අභ්‍යන්තර ක්‍රීඩාගාරයක් ලෙස භාවිතයට ගෙන තිබුනි.	අදාල විද්‍යාගාරයට විද්‍යාගාර උපකරණ ලබා ගැනිම සඳහා ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන නොලැබුණි. එම උපකරණ මිලදී ගන්නා තෙක්, අදාල විද්‍යාගාර පරිශ්‍රය ක්‍රීඩාගාරයක් ලෙස භාවිතා කරනු ලැබේ.
4.5 හඳුනාගන්නා ලද පාඩු --------------------------- පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. **(අ)** 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව 2006 සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය සඳහා දායක මුදල් නියමිත දින වලදී නොගෙවීම නිසා රු. 1,765,477 ක අධිභාර මුදලක් සහ සේවකයන්ගේ වැටුපෙන් අඩුකළ යුතු සියයට 8 ක දායකය වශයෙන් රු. 1,439,044 ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවා තිබුණි	විශ්වවිද්‍යාලය විසින් මෙම මෙහෙයුම් සහකරුවන් ලබාගනු ලැබුවේ පැවරුම් පදනමට වන අතර ඒ සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හෝ අර්ථසාධක අරමුදල් ගෙවිය යුතු බවට අවශ්‍යතායක් පැන නොනැගුන අතර විගනක අංශ මගින් පෙන්වාදීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල පාලක සභාවේ තීරණය මත ගෙවීම් කිරීමේදී මෙම ප්‍රමාදයන් සිදුවී ඇත. ඒ අනුව අදාල පරිදි අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගෙවා ඇත. අධිභාර මුදල් ගෙවීම සම්බන්ධයන් පාලක සභාව දැනුවත් කොට ඇති බව ද දන්වමි.
(ආ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට 2006 සිට 2012 ජනවාරි දක්වා අර්ධ වාර්ෂික වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම හා දායක මුදල් නියමිත නොගෙවීම හේතුවෙන් රු. 193,816 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි	

<table>
<tr>
<td>
4.6 ඉටු නොකළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වැඩ ආරම්භ කර 2011 වර්ෂයේ වැඩ නිමකළ යුතු පහත සඳහන් ව්‍යපෘති 2014 මැයි 30 දින වන විටත් ආරම්භ කර නොතිබුනි.

<table>
<tr><th>ඉදිකිරීම් වැඩ</th><th>වැඩ ආරම්භ කළයුතු දිනය</th><th>වැඩ නිමකළ යුතු දිනය</th><th>වටිනාකම රු.</th></tr>
<tr><td>පල්දෝරු පද්ධතිය</td><td>2010.08.16</td><td>2011.08.15</td><td>17,800/=</td></tr>
<tr><td>වැසි ජලය අපහරණ පද්ධතිය</td><td>2010.08.02</td><td>2011.01.28</td><td>23,190/=</td></tr>
</table>
</td>
<td>
ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් සංයුක්ත සැලැස්මේ මෙහි සඳහන් අපේක්ෂිත සියළු ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි විය.
</td>
</tr>
<tr>
<td>
4.7 මානව සම්පත් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්යය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 07 ක් හා ජ්‍යෂ්ඨ කථිකාචාර්ය තනතුරු 48 ක් සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි.
</td>
<td>
2006 වර්ෂයේ සිට එල කරනු ලැබූ සියළුම අධ්‍යයන කාර්යය මණ්ඩල බඳවා ගැනීම් පුවත්පත් දැන්වීම් වලදී මහාචාර්ය තනතුරු, ජ්‍යෂ්ඨ කථිකාචාර්ය තනතුරු 1,11 තනතුරු බඳවා ගැනීම සඳහා කටයුතු කළද, සුදුසුකම් ලත් කාර්යය මණ්ඩලයක් සිටි සෑම අවස්ථාවකදීම ඔවුන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. සම්මුඛ පරික්ෂණ වලදී ජ්‍යෂ්ඨ කථිකාචාර්යවරු නොමැති අවස්ථාවන්හීදී කථිකාචාර්යය (පරිවාස) තනතුර සඳහා උසස් කිරීමට කටයුතු කෙරේ. දැනට සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා 30 දෙනෙකු පමණ අධ්‍යයන නිවාඩු ලබා ඇති අතර ඔවුන් එම පශ්චාත් උපාධි සම්පූර්ණ කර පැමිණි පසු ඔවුන්ගේ ඉල්ලීම මත ජ්යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා උසස් කිරීමට කටයුතු කෙරේ.
</td>
</tr>
</table>

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පරිවාස කථිකාචාර්ය තනතුරු අනුමත සංඛ්‍යාව 69 ක් හා තත්‍ය සංඛ්‍යාව 87 ක් වීමෙන් තනතුරු 18 ක් අතිරික්තව තිබුණි	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා පුවත්පත් දැන්වීම් පල කළද ඔවුන් බඳවා ගැනීමට නොහැකි අවස්ථා වලදී කථිකාචාර්ය (පරිවාස) තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකෙරේ. ඔවුන් නියමිත සුදුසුකම් සපිරීමෙන් පසු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා උසස් කිරීමට කටයුතු කෙරේ.
(ඇ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ වන කොටසේ 33 වන වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර සඳහා සහ මූල්‍යාධිකාරි තනතුර සඳහා 2006 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.	පුස්තකාලාධිපති තනතුර සඳහා 2013.12.27 දිනට අවසාන පරිදි අයදුම්පත් කැඳවා සුදුසුකම් සපිරු අයදුම්කරුවන් ඉදිරිපත් නොවූ අතර මූල්‍යාධිකාරී තනතුර සඳහාද අවස්ථා කිහිපයකදීම පුවත්පත් දැන්වීම් පල කරනු ලැබුවද, සුදුසුකම් ලත් අයදුම්කරුවෙකු අයදුම්පත් ඉදිරිපත් කර නොතිබු බැවින් නැවත පුවත්පත් දැන්වීම් පලකිරීමේ කටයුතු කෙරෙමින් පවති.
(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 211 න් 89 ක් හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ තනතුරු 126 න් තනතුරු 83 ක් සම්පූර්ණ කර නොතිබුණි.	අංක 2.2.6 (ඈ) - (i) පිළිතුර අදාල වේ.
(ඉ) ලිපිකාර ඒකාබද්ධ සේවයට සම්බන්ධ පරිගණක යෙදවුම් සහායක පුරප්පාඩු 27 ක් සඳහා බඳවා ගැනීම් සිදු නොකර විශ්ව විද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවේ නොමැති මෙහෙයුම් සහකාර තනතුර සඳහා 2005 වර්ෂයේ සිට පැවරුම් පදනම මත වරින් වර සේවකයන් බඳවාගෙන තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට එලෙස සේවයේ යොදවා සිටි මෙහෙයුම් සහායකයින් සංඛ්‍යාව 21 කි.	අංක 2.2.6 (ඈ) - (i) පිළිතුර අදාල වේ.
05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය --------------------------------------- **5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම** 2002 මැයි 24 දිනැති අංක පී.එෆ්./පී.ඊ රාජ්‍යය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුනේ 2014 මැයි 07 දිනදීය. විගණන නිරීක්ෂණයන්ගෙන් අනතුරුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 11 දින හා 2014 නොවැම්බර් 21 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.	ප්‍රමාණවත් සහයක කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතු කොටගෙන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වූ අතර 2014 වර්ෂයේ සිට නියමිත කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි 01 දිනැති අංක 79/25 හා 79/24 පාලක සභා තීරණ අනුව අනුමත කරන ලද විශ්ව විද්‍යාලයේ 2013 සිට 2017 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මේ හා 2013 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති 12 ක ප්‍රමාණාත්මක බැහැරවීම් දක්නට තිබුණි.

සංයුක්ත සැලැස්මේ කේතාංක -----------	විස්තරය ------------	ක්‍රියාත්මක කළයුතු කාලවකවානුව ------------------	වර්තමාන තත්වය -------------	
1.1.1.1	විශ්වවිද්‍යාල භූමියේ සිටින කර්මාන්ත කරුවන් ඉවත් කිරිම හා ඔවුන් වෙනත් ස්ථානයක ස්ථානගත කිරිම	2013-01 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	අභියාචනාධිකරණ නඩු අංක 642/09 යටතේ විශ්වවිද්‍යාල භූමියේ සිටින කර්මාන්තකරුවන් ඉවත් කිරීමේ නීතිමය කටයුතු අධිකරණ කටයුතු සිදුවෙමින් පවතී. එම නඩුව 2014.06.03 දින අවසාන වරට කැඳවා ඇති අතර, අත්හිටුවීමේ නියෝගය 2014.09.26 දක්වා දීර්ඝ කර ඇත. මෙම කර්මාන්ත කරුවන් ඉවත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස නීතිපතිවරයාගෙන් ලිඛිතව ඉල්ලීම් කොට ඇත. අදාල ලිපියේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි.
1.1.2.2	ආගන්තුක සත්කාර, සංචාරක හා සිද්ධි කළමනාකරණය සඳහා කලාගාරයක් ඉදිකිරිම	2013-01 කාර්තුව සිට 03 කාර්තුව දක්වා	ආරම්භකර නොතිබුණි	ආගන්තුක සත්කාර සංචාරක හා සිද්ධි කළමනාකරණය සිසුන් සඳහා පරීක්ෂණාගාරයක් හා මුළුතැන් ගෙයක් E ගොඩනැගිල්ලේ ස්ථාපිත කොට ඇත. එම පරීක්ෂණාගාරය සඳහා ලීබඩු සහ අවශ්‍ය උපකරණ සියල්ල සපයා ඇත. සිසුන්ගේ ප්‍රායොගික අධ්‍යන කටයුතු එම පරීක්ෂණාගාර තුළ සිදුකරනු ඇත.
1.1.1.3	G කොටස ගොඩනැගිල්ලේ වහල පුනරුත්තාපනය	2013-01 කාර්තුව	- එම-	ඉතා ඉක්මනින් කළ යුතු අළුත්වැඩියා කටයුතු CECB ආයතනය මගින් සිදුකළ අතර සම්පූර්ණ වහල අළුත්වැඩියා කිරීම සඳහා වෙන් කරන ලද මුදල ප්‍රමාණවත් නොවූ බැවින් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම් සම්පූර්ණ වහල ප්‍රතිසංස්කරනය කිරීමට කටයුතු කරමි.

5.2.2.1	ශාරීරික අභ්‍යාස නිළධාරියෙකු පත්කිරීම සහ සහාය කාර්ය මණ්ඩලයක් පත්කිරීම	2013-01 කාර්තුව	සහාය කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබුණි	ශාරීරික අභ්‍යාස නිළධාරියෙකුගේ සේවාව සේවා සපයන්නෙකු මගින් ලබාගෙන ඇති අතර සිසුන්ගේ ක්‍රීඩා කටයුතු නියමිත ආකාරයෙන් සිදුකිරීමට අවශය පහසුකම් සපයා දී ඇත.
8.1.1.1	අන්තර්ජාතික ඉල්ලුමට අනුව උපාධි පාඨමාලා හඳුන්වා දිම	2013-01 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	දැනට පවත්වාගෙන යනු ලබන උපාධි පාඨමාලාවන්හි විෂයමාලා යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. එමෙන්ම අන්තර්ජාතික ඉල්ලුමට සරිලන ආකාරයට යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.
1.1.1.5	ක්‍රීඩා සංකීර්ණය සහ ගෘහස්ත ක්‍රීඩාගාරය ආරම්භ කිරම	2013-03 කාර්තුව	ආරම්භකර නොතිබුණි	කොන්ත්‍රාක්කරු විසින් ලබා දෙන සැළසුමේ සහ මිල ගණන් හි පැවති අඩුපාඩුකම් නැවත සමාලෝචනයට ලක් කොට සංශෝධිත මිල ගණන් ලබාගෙන ඇති අතර එහි පවත්නා අඩුපාඩු නිවැරදි කර අදාල ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරමි.
1.2.1.4	පුස්තකාල කටයුතු සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වාදීම	2013-02 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් Cloud Base Management Information System (CBMIS) නමින් නව කළමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කොට ඇත. එහි කටයුතු Advant Techservice private Limited නැමති ඉන්දියානු සමාගමක් වෙත මෙම කාර්යය පවරා ඇත. එහි මූලික කටයුතු 2014 ජූනි මස 04 වෙනි දින ආරම්භ කළ අතර එම තොරතුරු පද්ධතිය සකස් කිරීමට අදාල කටයුතු සිදුකරමින් පවතී. එම තොරතුරු පද්ධතිය යටතේ මොඩියුලර් 09 ක් ස්ථාපිත කිරීමට අදාල කටයුතු සිදුකරමින් පවතී.
1.2.2.2	විශ්වවිද්‍යාලයේ සම්පත් සැලසුම්කරණ සඳහා මාර්ගගත වෙබ් මත පදනම් වු තොරතුරු පද්ධතියක් හඳුන්වා දිම	2013-01 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	අංක 1.2.1.4 පිළිතුර අදාල වේ.

2.1.3.1	නව උපාධි පාඨමාලා හදුන්වාදිම	2013-02 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	වෛද්‍ය පීඨයක් ස්ථාපිත කොට නව උපාධි පාඨමාලා හඳුන්වා දීමට මූලික කටයුතු සිදු කරමින් පවති. මෙම නව උපාධි පාඨමාලා ආරම්භ කිරීමට අදාල යෝජනාව සකස් කොට ඇති අතර එය සමාලෝචනය කිරීම සඳහා විද්වත් කමිටුවක් වෙත යොමුකර ඇත. ඒ සම්බන්ධ කටයුතු කිරීම සඳහා පාලක මණ්ඩලය මඟින් අනුකමිටුවක් පත්කර ඇත. එම කමිටුව අදාල කටයුතු සිදු කරමින් පවති.
2.1.3.2	සහතිකපත් පාඨමාලා හදුන්වා දිම	2013-01 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලා දෙකක් ක්‍රියාමත්මක කරන අතර තොරතුරු තාක්ෂණ පාඨමාලා දෙකක් ක් ආරම්භ කිරීමට කටයුතු යොදවා ඇත. ඌව පළාත් ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් වැඩමුළු කිහිපයක් පැවැත්වීමට අදාල කටයුතු සංවිධානය කොට ඇත.
5.1.3.2	විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සඳහා වෛද්‍යාධාර සහ රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරිම	2013-01 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	වෛද්‍යාධාර සහ රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට අදාල කටයුතු සිදුකරමින් පවති.
8.1.1	විදේශ සිසුන් ආකර්ශණය කිරිමට වැඩපිළිවලක් සැකසිම	2013-01 කාර්තුව	ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	අංක 1.2.1.4 පිළිතුර අදාල වේ.
(ආ) 2013 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම, ඉටුකර ගතයුතු ඉලක්කයන්ගේ මූලාමය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.				අදාල සංශෝධනයන් සහිතව සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. සපුරා ගත යුතු ඉලක්ක KPI වශයෙන් සංයුක්ත සැලැස්මේ දක්වා ඇත. සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුල් කර ඇති අතර මූල්‍යමය අගයන් දැක්විය හැකි කාර්යයන් සඳහා මූල්‍යමය අගයන් දක්වා ඇත.
5.3 ක්‍රියාකාරී සැලැස්ම ---------------------- 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්යසාධන වාර්තා දෙවන කාර්තුවේ සිට සකස් කර නොතිබුණි.				භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්යය සාධන වාර්තා සකස් කිරීමට කටයුතු කරමි.

5.4 අභ්‍යන්තර විගණනය ----------------------------- **(අ)**කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මෙහෙයුම් සහකරුවන් දෙදෙනෙකු විසින් 2013 වර්ෂයේ අභ්‍යන්තර විගණන කටයුතු ඉටුකරනු ලබන අතර ස්ථිර පළපුරුදු කාර්යය මණ්ඩලයක් යොදවා ගෙන නොතිබුණි.	මෙම විශ්වවිද්‍යාල සේවකයන් බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අභ්‍යන්තර විගණන අංශය සඳහා ද සේවකයන් යොදවා ඇත.
5.5 ප්‍රසම්පාදන සැලැස්ම -------------------------- **(අ)**2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.2.1 (ඉ) හා 4.2.2 ඡේද ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණ අතර ප්‍රසම්පාදන කාල සැලැස්මක්ද සකස් කර නොතිබුණි.	ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.
5.6 අයවැය ලේඛනමය පාලනය ---------------------------------- පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. **(අ)** 2013 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් මූලධන වියදම් සඳහා ලබා දී තිබුණ රු. 303,790,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු. 126,033,453 ක් ඉතිරි කර තිබුණි. එය සමස්ථ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 32 කි.	2013 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ප්‍රතිපාදන නිදහස් නොකිරීම මත මෙම ඉතිරිය ඇති වී ඇත.
(ආ) ඇස්තමේන්තුගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයන් 05 ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 23 සිට සියයට 81 දක්වා විචල්‍යක් සහ ප්‍රාග්ධන වැය විෂයන් 05 ක් සඳහා වෙන්කර තිබුණ ප්‍රතිපාදන වලින් සියයට 23 සිට සියයට 96 දක්වා වූ සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	2013 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා පුනරාවර්ථන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන නිදහස් නොකිරීම මෙම විචල්‍යයට හේතු වී ඇත.
5.8 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණය -- 2012 සැප්තැම්බර් 21 දින පැවැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීමට මේ දක්වා විශ්වවිද්‍යාලය අපොහොසත්ව තිබුණි.	මෙම ව්‍යාපෘතියේ පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කරන ලෙසට කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත. එම ප්‍රමිතීන් නිසියාකාරව නිමකර දෙනතෙක් ඒ අදාල ඉදිකිරීම් සඳහා මුදල් නොගෙවීමට තීරණය කර ඇත.

5.9 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම --- **අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය** --- 2010 ඔක්තෝම්බර් 05 දිනට ජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තුව රු. 23,190,000 ක මුදලකට මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය CECB වෙත පිරිනමා තිබුණි . 2011 ජනවාරි 03 දින ඉදිකිරීම් නිමකර විශ්වවිද්‍යාලය වෙත භාර දී තිබුණු මෙම ව්‍යාපෘතිය අසාර්ථක බැවින් පුනරුත්ථාපනය කිරීම මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය විසින් 2013 ජුනි ආරම්භකර තිබු නමුත් අදාල කාර්යන් අතරමඟ ඇණහිට තිබුණි. එබැවින් වර්තමානයේ ජලය පිරිපහදු නොකර පරිසරය වෙත මුදාහැර තිබුණි.	පල්දෝරු පද්ධතියේ නියමිත පරිදි ක්‍රියාමත්මක නොවීම හේතු කොට ගෙන ඒ සම්බන්ධයෙන් උපදේශක වාර්තාවක් පේරාදෙණිය විශ්වවිද්‍යාල අචාර්ය ජී.බී.බී. හේරත් සහ ආචාර්ය සී.එස්. කල්පගේ මහත්වරුන්ගෙන් ලබා ගෙන අපවෙත ඉදිරිපත් කළ අතර අප විසින් එය පරීක්ෂා කර එම වාර්තාවේ කරුණු වලට අනුකූලව අදාල ව්‍යාපෘතින් ක්‍රියාමත්මක කරන ලෙස 2013 මැයි 17 දින CECB ආයතනයට දන්වන ලදි. CECB ආයතනය එම ව්‍යාපෘති කටයුතු සිදුකරන අතරතුර නඩත්තු කටයුතු සඳහා (විදුලිය) අධික මුදලක් දැරීමට සිදුවන බව අණාවරණය විය. ඒ අනුව මාසික විදුලි වියදම් අවම වන ආකාරයෙන් අදාල යෝජනාව සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන ලෙස CECB ආයතනය වෙත දන්වා ඇත.
06. පද්ධති හා පාලනයන් ------------------------ විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ. (අ) ගිණුම්කරණය (ආ) වත්කම් කළමනාකරණය (ඇ) ගබඩා පාලනය (ඇ) මූල්‍ය කළමනාකරණය හා වියදම් පාලනය (ඉ) මානව සම්පත් කළමනාකරණය	මෙම ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමුකර පද්ධති හා පාලන දුර්වලතා මඟ හරවා ගැනීමට ඉදිරියේදී විශේෂ අවධානය යොමුකර කටයුතු කරමි.